**පොල් පර්යේෂණ මණ්ඩලය - 2018**
------------------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කල යුතු වුවත්,පිරිවැය රු.1,522,283,874 ක් වූ ඉඩම් සහ පිරිවැය රු.210,074,759 ක් වූ ගොඩනැගිලි 2005 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි. | දැනටමත් මෙම ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරගෙන යනු ලබයි. | ප්‍රමිතිය ප්‍රකාරව අදාල වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.61,901,689 ක් වූ රථ වාහන 126 ක්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම වත්කම් වල ඵලදායී ජීවිත කාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ආයතනයේ සෑම වත්කම් පන්තියක් සඳහාම විශාල වත්කම් ප්‍රමාණයක් පවතින බැවින් මෙම කාර්ය කෙටි කාලයකින් සිදු කිරීම ඉතා අපහසු කාර්යයකි. එබැවින් මෙහි එක් එක් වත්කම් පන්තිය බැගින් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව දන්වමි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් නැවත ප්‍රයෝජනයට ගන්නා බැවින් එම වත්කම් ඵලදායී ජීවිත කාලය සලකා බලා නැවත ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයෙන් ඉවත් කරන ලද වත්කම් මඟින් ඉපයූ ලාභය ගණනය කිරීමේදී එම වත්කම් වලට අදාල වර්ෂයේ ක්ෂය රු.82,750 ක් සහ රු.1,084,750 ක ක්ෂය වෙන් කිරීම්, ගිණුම් වලින් ඉවත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වත්කම් ඉවත් කිරීමේ අලාභය රු.1,167,500 කින් අධි ගණනය වී තිබුණු අතර දේපල පිරියත උපකරණ පිරිවැය රු.1,084,750 කින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වත්කම් ඉවත් කරන වර්ෂයට අදාළ ක්ෂය වීම් ගැලපීම අතපසු වී ඇති බැවින් 2019 වර්ෂයේ ගිණුම් තුළ ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | වත්කම් ඉවත් කිරීමේදී එම වත්කම් වල පිරිවැය සහ ක්ෂය වෙන්කිරීම අදාල ගිණුම් වලින් ඉවත්කර මූල්‍ය ප්‍රකාශන වල පෙන්විය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ රසායනාගාර උපකරණ මිලදී ගැනීම් රු.2,200,000 ක් සහ මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම් රු.9,850,658 ක ප්‍රාග්ධන වියදම් වර්ෂයේ පුනරාවර්ථන වියදම් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.12,050,658 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | වියදම් ගිණුම්ගත කිරීමේදී නිවැරදිව පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් හඳුනා ගෙන ගිණුම් වල දැක්විය යුතුය. |
| (ඇ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ පාරිතෝෂිත වෙන්කිරීම් රු.39,139,186 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල්මය නොවන වෙනස් වීම් යටතේ එය රු.38,780,938 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය රු.358,248 ක් අඩුවෙන් නිරූපණය විය. | ආයතනයේ නිළධාරින් 07 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද පාරිතෝෂිත මුදල් වන රු.456,979 ක මුදල, ආයතනයේ අස් වී ගිය නිලධාරින් 03 දෙනෙකු සඳහා ගෙවන ලද රු. 601,250 ක මුදල සහ විදේශ ගත වී ඇති නිලධාරියෙකුගේ පාරිතෝෂිත මුදල, ඔහුගේ ඇප බැඳුම්කරයට හිලව් කිරීම රු.213,978 ක් වියදම් ගිණුම තුළින් ගැලපීම මෙම වෙනසට හේතු විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පාරිතෝෂිත වෙන්කිරීම් ලෙස රු.39,139,186 දක්වා තිබියදී ඊට අදාල නිවැරදි ශේෂය ඇතුළත් කළ යුතුය. |

## 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.32,223,012 ක විවිධ ණයගැතියෝ සහ රු.1,338,457 ක විවිධ ණයහිමියන්ගේ ශේෂය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් ලිපි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | සියලු ණයගැති හා ණයහිමි ශේෂ තහවුරු කර ගැනීමේ ලිපි (Confirmation Letters ) යැවූ නමුත් වටිනාකම් තහවුරු කර නැත. | සෘජුවම විගණනය වෙත අදාල ශේෂයන් තහවුරු කරන ලෙස අදාල පාර්ශවය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා වෙනුවෙන් 2012 වර්ෂයේ පෞද්ගලික ආයතනයකට රු.159,936 ක පූර්ව වැඩ සඳහා වූ අත්තිකාරම් ලබා දී තිබුණද අදාල අත්තිකාරම් මුදල් පියවා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානයෙහි නිළ නිවසක් සහ සංචාරක බංගලාවෙහි අලුත්වැඩියාවක් වෙනුවෙන් ගෙවන ලද අත්තිකාරමකි.මෙය 2012 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර,එම උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | අත්තිකාරම් මුදල් අදාල ඉදිකිරීම් කටයුතු අවසානයේදී කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)මු.රෙ.(396) (ඇ) | පාරිතෝෂිත ගෙවීම්,නඩත්තු වියදම් සහ රසායන උපකරණ මිලදී ගැනීම් වෙනුවෙන් ලබා දී තිබූ රු.349,040 ක් වටිනා චෙක්පත් 03 ක් මාස 06 කට වැඩි කාලයක් | මෙම චෙක්පත් දින දීර්ඝ කොට නැවත අදාල පුද්ගලයින් වෙත යවා ඇත.නමුත් එම චෙක් පත් දිගින් දිගටම ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන්නේ නම් අදාල පුද්ගලයන් දැනුවත් කොට අවලංගු කිරීමට කටයුතු කරන බව දන්වමි. | මාස 6 කට වඩා කල් ඉකුත් වූචෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත්ව නොතිබියදී ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | | |
| (ආ)2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 85(i)(අ) වන වගන්තිය | ගෙවීම් කරන තැනැත්තාගේ සේවා නියුක්තිකයෙකු නොවන වාසික පුද්ගලයෙකු වෙත කරනු ලබන සේවා සැපයීම් සහ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා ගෙවනු ලබන මුදල මසකට රු.50,000 ඉක්ම වන්නේ නම් 5% ක රඳවා ගැනීමේ බද්දක් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් පුද්ගලයන් 05 ක් සඳහා අවස්ථා 08 කදී ගෙවන ලද රු.7,778,442 ක් වන කොන්ත්‍රාත් ගෙවීම් සඳහා වන රු.388,922 ක රඳවා ගැනීමේ බද්ද අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | මෙම ගෙවීම් වලින් රඳවා ගැනීමේ බදු අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම 2019 වර්ෂයේ මුල සිට ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වමි. | අදාල පනතේ විධිවිධාන අනුව රඳවා ගැනීමේ බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තු වට යැවිය යුතුය. |
| (ඇ) මු.රෙ.756 | රු.3,159,059 ක් වටිනා පුස්ථකාල පොත් සහ වාර සඟරා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සමීක්ෂණය කර නොතිබුණි. | පුස්තකාල පොත් සහ වාර සඟරා සඳහා වාර්ෂික සමීක්ෂණය මෙම වසරේ සිදු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පුස්ථකාල පොත් සමීක්ෂණය කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.58,993,686 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.26,752,992ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.85,746,678 ක පිරිහීමක් නිරීක්ෂණය විය.පර්යේෂණ මධ්‍යස්ථාන වල ආදායම් රු.28,358,135 කින් අඩු වීම සහ පර්යේෂණ මධ්‍යස්ථාන වල වියදම් රු.35,944,277 කින් වැඩි වීම මෙහෙයුම් ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

ජංගම අනුපාතය ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා 1:1.35 සිට 1:1.42 දක්වාද ක්ෂණික අනුපාතය 1:0.96 සිට 1:1.04 දක්වාද වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 5.04 ක් වූ ලාභ අනුපාතය සියයට 11.25 ක අලාභයක් බවට පත්ව තිබුණි. පොල් සහ පොල් පැළ විකුණුම් ආදායම් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

# 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොල් වගාව තුළ බැටළුවන් ඇති කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂ වලදී රු.1,121,678 ක වියදමක් දරා තිබුණත් ව්‍යාපෘතිය භාරව සිටි නිළධාරියා සේවය හැරයාමේදී මෙම පර්යේෂණයට අදාල තොරතුරු මණ්ඩලයට භාර නොදීම මත එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | මෙම පර්යේෂණය වෙනත් ආකාරයකින් සිදු කිරීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇති අතර මෙම පර්යේෂණය සඳහා මිලදීගත් ද්‍රව්‍ය උපයෝගි කොටගෙන එළු හා බැටළු මඩු සඳහා ජල සම්පාදනය සිදු කර ඇත.එමෙන්ම පොල් වගාවේ වල් පැලෑටි පාලනය සඳහා මෙම සතුන් කෙසේ යොදා ගත හැකිද යන්න සොයා බැලීම සඳහා පැඩොක් ක්‍රමය යටතේ සතුන් යෙදවීම පිළිබඳව පර්යේෂණය ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී.ඒ සඳහා මෙම පර්යේෂණයට මිලදී ගත් කම්බි හා බට යොදා ගෙන ඇත. | අදාල පර්යේෂණ ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කිරීම එම පර්යේෂණය භාර නිලධාරියාගේ වගකීමක් වන අතර එම වගකීම නොසලකාහැර කටයුතු කිරීම පිළිබඳ අදාල ක්‍රියාමාර්ග ගැනීම කළමනාකරණයේ වගකීමක් වේ. |
| (ආ) | වියලි කාලගුණය හේතුවෙන් බීජ නිෂ්පාදනය අඩු වීම සලකා බලා අවශ්‍ය ජලය ලබා දීමට ප්‍රමාණවත් වාරි පද්ධති ස්ථාපිත කිරීම සහ නව පොල් ප්‍රභේද මගින් අස්වැන්න වැඩි කර ගැනීමට මණ්ඩලය විසින් ක්‍රියා නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ 1,107,642 ක් වූ බීජ නිෂ්පාදන 2018 වර්ෂයේදී 828,070 ක් දක්වා අඩු වී තිබුණි. | බීජ නිෂ්පාදනය ද සාමාන්‍ය පොල් අස්වැන්න වෙනස් වීමක් පෙන්නුම් කරයි. බීජ පොල් උයන් සඳහා 2017 වර්ෂයේදී ජල සම්පාදන පද්ධති හඳුන්වා දීම ආරම්භ කල අතර මේ වනවිට මාදුරුඔය බීජ පොල් උයන ආවරණය වන පරිදි ජල සම්පාදන පද්ධති ස්ථාපිත කර ඇත.අඹලේකැ සහ පල්ලමජාන සම්පත් මධ්‍යස්ථාන සඳහා ජල සම්පාදන පද්ධති ස්ථාපිත කර ඇතත්, සම්පූර්ණ බීජ පොල් උයන් ආවරණය සඳහා විශාල මුදලක් වැය වේ.ඉදිරියේදී මෙම බීජ පොල් උයන් දෙක සම්පූර්ණයෙන් ආවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාණවත් පරිදි ජලය නොලැබීම නිසා පොල් ඵලදාව අඩු මට්ටමක පවතින වතු සඳහා වාරි පද්ධති ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබූ රු.11,925,500 ක් ප්‍රතිපාදන වෙන් කර තිබූ පර්යේෂණ ව්‍යාපෘති 07 ක භෞතික කාර්යය සාධන මට්ටම සියයට 45 ත් 80 ත් අතර විය. මෙයට ප්‍රධාන වශයෙන් පර්යේෂණ නිලධාරීන්ගේ හිඟය, පර්යේෂණ නිලධාරීන් සේවය අත්හැර යාම, රසායනික ද්‍රව්‍ය නොලැබීම,රසායනික උපකරණ මිලදී ගැනීමට ප්‍රමාද වීම හේතු වී තිබුණත් මේ සඳහා කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | නිලධාරි හිඟය , පර්යේෂණ නිලධාරීන් ආයතනයේ සේවයෙන් ඉවත්ව විශ්ව විද්‍යාල සේවයට බැඳීම්,අළුතින් බඳවා ගන්නා නිලධාරීන් කෙටි කාලයකින් වෙනත් රැකියා සඳහා මාරු වීම් ආදිය පර්යේෂණ ව්‍යාපෘති වල භෞතික කාර්ය සාධන මට්ටම පහත යාමට හේතු විය. මෙම තත්වය නිවැරදි කර ගැනීමට සියළු කටයුතු සිදුකරනු ඇත. | පර්යේෂණ ව්‍යාපෘතිය වල කාර්යය සාධන මට්ටම අඩු වීමට බලපාන කරුණු සොයා බලා ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | වියලි කාලගුණ තත්ත්වයන් යටතේ පොල් ගසේ ක්‍රියාකාරීත්වය මනාව පවත්වාගෙන පොල් ඵලදාව ආරක්ෂා කර ගැනීමට උපකාරී වන පසේ ජීවත්වන ක්ෂුද්‍ර ජීවීන් හඳුනාගැනීමේඅරමුණින් ආරම්භ කරන ලද Isolation & Identification of Vascular Arbuscular Mycorrhizae (VAM) From Coconut Land ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.273,000 ක වියදමක් දරා තිබූ අතර 2019 වර්ෂයෙන් නිම වීමට තිබූ මෙම ව්‍යාපෘති භාර පර්යේෂණ නිලධාරියා විදේශ ගත වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නවතා දමා තිබූ අතර එම නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු යොදවා පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | මෙම පර්යේෂණය සම්බන්ධ ප්‍රධාන පර්යේෂණ නිලධාරිනිය පශ්චාත් උපාධිය සඳහා 2018 මැද භාගයේ සිට විදේශ ගත විය. එමෙන්ම මෙම පර්යේෂණය ක්ෂුද්‍ර ජීවීන් හා සම්බන්ධ පර්යේෂණයක් වන අතර ඒ සඳහා සුවිශේෂී දැනුමක්ද මෙම පර්යේෂණය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය බවත්, 2018 මැද භාගයේ සිට ඒ සම්බන්ධව විශේෂිත දැනුම ඇති පර්යේෂණ නිලධාරින් නොමැති බැවින් මෙම පර්යේෂණය තාවකාලිකව අත්හිටුවන ලදී. | පර්යේෂණ ව්‍යාපෘති භාර නිලධාරියන් වෙනස් වන විට පර්යේෂණ ව්‍යාපෘතිය අත්හිටුවීම වැලැක්වෙන පරිදි පර්යේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | වර්ෂ 1992–2014 කාල පරාසය තුළ විදේශගතව නැවත සේවයට නොපැමිණි විදේශ ශිෂ්‍යත්වලාභීන් 09 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.28,588,853 ක මුදල අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 1992-2014 කාල පරාසය තුල විදේශගතව සේවයට නොපැමිණි සහ ඇප බැඳුම්කර ගෙවීම් පැහැර හැර සේවයෙන් ඉවත් වූ ශිෂ්‍යත්වලාභීන් 09 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.28,588,853 ක මුදල් අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නඩු කටයුතු සිදු තරමින් පවතී. | නඩු කටයුතු අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගෙන අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වසර 03 ක කාලයක් සඳහා ඇතිකරගෙන තිබූ අවබෝධතා ගිවිසුම අනුව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙත සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලය වෙත පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලබා දී ඇතිපිළිවෙලින් රු.989,601 ක් සහ රු.2,156,153 ක් අත්තිකාරම් මුදල් 2017 වර්ෂය අවසාන වන විට පියවිය යුතු වුවත් එම අත්තිකාරම් පියවා ගැනීමට කලමනාකරණය කටයුතු කර නොතිබුණි. | පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමට අදාල පර්යේෂණ කටයුතු නියමිත කාලය තුලදී නිම කිරීමට නොහැකි විය.මෙම අධ්‍යනයේ මුල් අදියර සමීක්ෂණ මඟින් සිදු කිරීමට සැලසුම් කර තිබූ අතර, ඒ සඳහා සුදුසු සංගහන තෝරා ගැනීමේදී අනපේක්ෂිත කාලයක් වැය විය. එබැවින් මෙම පර්යේෂණය අපේක්ෂිත කාලය තුල නිම කිරීමට නොහැකි වූ අතර ,මෙම පර්යේෂණ වල ප්‍රතිඵලයන් පොල් කර්මාන්තයේ ප්‍රවර්ධනයට හේතු විය හැකි බැවින් එහි නිමාව වැදගත් වන නිසාත් අවබෝධතා ගිවිසුමෙහි කාලය දිගුකර වැඩ කටයුතු නොකඩවා කරගෙන යාමට කටයුතු කරගෙන යන බව දැනුම් දෙමි. එබැවින් අත්තිකාරම් මුදල පියවීමට කටයුතු නොකරන ලදී.<br>කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය සමඟ ඇති අවබෝධතා ගිවිසුමට අදාල පර්යේෂණ කටයුතු ආරම්භ කර ඇති අතර,මෙම පර්යේෂණ තුලින් පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා ඇති වැදගත්කම සලකා අවබෝධතා ගිවිසුම තවදුරටත් දීර්ඝ කිරීමට කටයුතු කරමින් සිටින බැවින් අත්තිකාරම් මුදල පියවීමට කටයුතු නොකරන ලදී. | අවබෝධතා ගිවිසුමේ කාලය තුළ පර්යේෂණ ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2018 පෙබරවාරි මස කපා දමන ලද රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් රු.3,428,678 ක තක්සේරු වටිනාකමක් වූ තේක්ක ගස් 112 ක ප්‍රමාණයක් අලෙවිකර ගැනීමට නොහැකිව දිරාපත් වෙමින් පැවතුණි. | රත්මලාගාර වත්ත සඳහා නිරවුල් ඔප්පුවක් සහ පිඹුරක් ඇත.නමුත් මුලදී මේ සඳහා ඔප්පුව ඉදිරිපත් කිරීමේදී නිවැරදි ඔප්පුවේ ලියාපදිංචි අංකය වෙනුවට ඔප්පුවේ ඇති වෙනත් අංකයක් ඉදිරිපත් කර ඇති බැවින් මෙම තත්වය ඇති වී ඇත. | අදාල ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට පෙර ගස් කැපීමට තීරණය කල නිලධාරීන්ට එරෙහිව අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |